**ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම**

**පර්යේෂණ යෝජනාවක් ලිවීම පිළිබඳ තේමා පාඨමාලාව -2026**

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සැලසුම් කර ඇති ඉහත දැක්වෙන පර්යේෂණ තේමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ගුරුවරුන්, අධ්‍යාපන නිලධාරීන්, ගුරු අධ්‍යාපනඥයින්, විදුහල්පතිවරුන්, ගුරු සිසුන් සහ පර්යේෂණ පිළිබඳ ළැදියාවක් දක්වන්නන් සඳහා මෙම පාඨමාලාවට අයදුම් කළ හැකි ය.

**පාඨමාලාවේ අන්තර්ගතය**

- පර්යේෂණ පසුබිම, ගැටලුව, ගැටලු ප්‍රකාශය
- සාහිත්‍යය විමර්ශනය
- පර්යේෂණ ප්‍රශ්න/අරමුණු /කල්පිත ගොඩ නැගීම
- පර්යේෂණ ක්‍රමවේදය
- පර්යේෂණ සීමා සහ ආචාර ධර්ම, කාල රාමුව, අයවැය, මූලාශ්‍ර දැක්වීම

| | |
|---|---|
| **දිනයන්** | : 2026 මැයි 08, 09 සහ 10 |
| **මාධ්‍යය** | : **සිංහල** |
| **අයදුපත් ගාස්තුව** | : රු. 500.00 |
| **ලියාපදිංචි ගාස්තුව** | : රු. 500.00 |
| **පාඨමාලා ගාස්තුව** | : රු. 6000.00 |

**විමසීම්**

| | |
|---|---|
| **අධ්‍යක්ෂ** | : 0117 - 601790 |
| **සම්බන්ධීකාරක** | : 0117 - 601863 |
| **කාර්යාලය** | : 0117 - 601795 |

**අයදුම්පත් එවීම සඳහා උපදෙස්** -

ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස **https:/www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගත ව පමණක් අයදුම්පත යොමු කළ යුතු ය.**

**පියවර 01 - අයදුම්පත පිරවීම**

- ඉහත වෙබ් අඩවියට ප්‍රවේශ (sign up) වන්න. තොරතුරු සපයන්න. එහි දී ඔබට ලැබෙන පරිශීලක අංකය (User ID) සටහන් කර තබා ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) සටහන් කර තබා ගන්න.
- වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න (Log in).
- ඔබ පිළිබඳ තොරතුරු (User profile) සම්පූර්ණ කරන්න.
- නව ප්‍රවේශ (New enrollment) වෙත පිවිසෙන්න.
- ඔබට නියමිත පාඨමාලාවේ අයදුම් පත්‍රයට ප්‍රවේශ වන්න (My application).

**පියවර 02 මුදල් ගෙවීම**

- ගෙවීම (Payment) සඳහා ප්‍රවේශ වන්න. මෙහි දී ඔබ වෙත ලැබෙන ගෙවීම් යොමු අංකය (Payment reference number) යොදා එහි දක්වා ඇති ගිණුමට අයදුම්පත් ගාස්තුව වන **රු.500/-** ක මුදල ගෙවන්න.
- අයදුම්පත් යොමු කිරීම සඳහා තාක්ෂණික සහාය අවශ්‍ය වන්නේ නම්, **0117601776** හෝ **0117601777** දුරකථන අංකයන්ට සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.

මාර්ගගත ව පිර වූ අයදුම්පතෙහි පිටපතක් බාගත කර (Download) අයදුම්පත් ගාස්තු ගෙවන ලද රිසිට් පතෙහි පිටපත සමග **2026/04/30** දින හෝ ඊට පෙර (රැකියාවල නියුතු වන්නේ නම් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයෙන් අනතුරුව) **අධ්‍යක්ෂ, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **පර්යේෂණ යෝජනාවක් ලිවීම පිළිබඳ තේමා පාඨමාලාව** -2026 යනුවෙන් සඳහන් කරන්න.

**සැලකිය යුතුයි.**

- පාඨමාලා ගාස්තු බැංකුවට හෝ බැංකු කාර්ඩ්පත් මඟින් (Credit හෝ Debit) සිදු කළ හැකි ය.
- ගෙවූ බවට සනාථ වන (මාර්ගගත ව/බැංකු ශාඛාවකට) රිසිට්පතෙහි පිටපත අයදුම් පතට ඇමිණීම අනිවාර්ය වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම